# සාමාන්‍ය සමයේ විසිතුන්වන සතිය
# සෙනසුරාදා

## පළමුවන කියැවීම

ශුද්ධවූ පාවුලු තුමන් විසින් තිමෝතියස් තුමන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

1 තිමෝති 1: 15-17

**"පව්කාරයන් ගළවන්නට ක්‍රිස්තුස් වහන්සේ ලෝකයට වැඩිය සේක."**

පව්කාරයන් ගළවන්නට ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ ලෝකයට වැඩිය සේක යන කීම විශ්වාස කටයුතු සියල්ලන් විසින් පිළිගත යුතු කියමනකි. ඔවුන් අතරෙන් ප්‍රධාන පව්කාරයා මම ය. එසේ වූ නමුත් මට දයාව ලැබුණේ මේ නිසාම ය. එසේ කිරීමෙන් ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ ඉවසීම සීමා රහිත බව උන් වහන්සේ පැහැදිලි කළ සේක.

සදාතන ජීවනය ලබා ගැනීම පිණිස උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබන සියල්ලන්ට ම මා ආදර්ශයක් වෙන්නට උන් වහන්සේ සැලැස්වූ සේක. අමරණීය වූ, අදෘශ්‍යමාන වූ, සදාතන රජ වූ එකම දෙවියන් වහන්සේට ගෞරවයත් මහිමයත් සදහට ම වේවා! ආමෙන්.

දේව වචනය මෙසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 113 : 1 – 7

පිළිතුර: සමිඳුන්ගේ නාමයට සදා ප්‍රශංසා වේවා!

ගීය:

සමිඳුන්ට ප්‍රශංසා කරන්න. සමිඳුන්ගේ මෙහෙකරුවෙනි, ප්‍රශංසා කරන්න. සමිඳුන්ගේ නාමයට ප්‍රශංසා කරන්න.
මෙතැන් පටන් සදහට ම සමිඳුන්ගේ නාමයට ප්‍රශංසා වේවා!

සමිඳුන්ගේ නාමයට නැගෙනහිර පටන් බස්නාහිර දක්වා ප්‍රශංසා කටයුතු ය. සියලු ජාතීන්ට ඉහළින් සමිඳාණෝ වැජඹෙන සේක. එතුමන්ගේ මහිමාලංකාරය අහස් තලය ඉක්මවයි.

අපේ දෙවි සමිඳුන්ට සමාන අන් කෙනෙක් නැත. එතුමාණෝ උස් තැන්හි වැඩ හිඳින සේක.
එහෙත්, අහසත් පොළොවත් බලන පිණිස එතුමාණෝ පහතට නැමෙන සේක. එතුමාණෝ ධූලියෙන් නැගිටුවන සේක. දිළිඳා කසළ ගොඩින් ඔසවන සේක.

## සුබපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
“මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි.
මා මගින් මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙත නොපැමිණෙන්නේ ය”යි ස්වාමීන් වහන්සේ වදාරන සේක.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
"යමෙක් මට ප්‍රේම කරන්නේ නම් හෙතෙම මාගේ ධර්මය පිළිපදින්නේය. මාගේ පියාණන් වහන්සේ ද ඔහුට ප්‍රේම කරන සේක. අපි ඔහු වෙතට පැමිණ ඔහු සමඟ වාසය කරන්නෙමු"යි ස්වාමීන් වහන්සේ වදාරන සේක.
ආලේලූයා!

## සුවිශේෂය

ලූක්තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 6: 43-49

**"මා වදාරන දෙය නොකර මට ස්වාමිනී, ස්වාමිනී යි කියන්නේ මන්ද?"**

ජේසුස් වහන්සේ මෙසේ වදාළ සේක. "නරක පල දෙන හොඳ ගසක් වත්, හොඳ පල දෙන නරක ගසක් වත් නැත. එක එක ගස එහි පලවලින් හඳුනාගනු ලැබේ. මිනිස්සු කටු ගස්වලින් අත්තික්කා පල නෙළා නොගනිති. ගොකටු පඳුරකින් මිදි පල කඩා නොගනිති. යහපත් මිනිසා තම සිතෙහි තිදත් කළ යහපත් දෙයින් යහපත් දෙය ද, අයහපත් මිනිසා අයහපත් දෙයින් අයහපත් දෙය ද උපදවයි. මන්ද, සිතෙන් උතුරා යන දෙය කටින් පිටවේ."

"මා වදාරන දේ නොකර මට 'ස්වාමිනී, ස්වාමිනී'යි කියන්නේ මන්ද? මා වෙතට විත් මාගේ අනුශාසන අසා ඒවා පිළිපදින අය කවරෙකුට සමාන දැ යි ඔබට පෙන්වමි. ඔහු ගැඹුරට පොළොව කැණ, පර්වතය මත

අත්තිවාරම දමා, ගෙයක් සෑදූ මිනිසෙකුට සමාන ය. ජල ගැල්මක් පැමිණ සැඩ පහර ඒ ගෙට ගැසූ නමුත් එය මනා ලෙස ඉදි කොට තිබුණු බැවින් සොලවන්නට නොහැකි විය. එහෙත් වචනය අසා නොපිළිපදින තැනැත්තා අත්තිවාරම නැති බිමෙහි ගෙයක් තැනූ මිනිසෙකුට සමාන ය. සැඩ පහර ඒ ගෙට ගැසීය. එවේලේම එය ඇද වැටුණේය. එහි විනාශය ද භයංකර විය.”

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේය.